**මොරටුව මහා නගර සභාව**
**කොළඹ දිස්ත්‍රික්කය**
**--------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 30 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජුනි 30 දින සභාවේ නගරාධිපතිවරයා වෙත යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට මොරටුව මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව සතුව තිබූ ගිලන් රථය මගී රථයක් බවට පරිවර්තනය කිරීම වෙනුවෙන් පෞද්ගලික ආයතනයක් වෙත ගෙවන ලද රු.1,915,000 ක මුදල ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ආ) වාණිජ සහ වෙළඳ පරිශ්‍රවලින් කසල බැහැර කිරීම වෙනුවෙන් වර්ෂයට අදාල ආදායම රු.360,000 ක් වැඩියෙන් ගිණුම් ගත කිරීම හේතුවෙන් වර්ෂයේ ආදායම හා වාණිජ සහ වෙළඳ පරිශ්‍රවලින් ලැබිය යුතු ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පළාත් පාලන ආයතන වෙත සභික දීමනා ප්‍රතිපූර්ණය කිරීම සම්බන්ධයෙන් වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් සහා අරමුදලින් දරා ඇති පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූර්ණය කිරීම ප්‍රතික්ෂේප කර ඇති රු.4,817,000 ක් වූ සභික දීමනා ලැබිය යුතු ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම හා ලැබිය යුතු ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ වැටුප් ප්‍රතිපූර්ණ මුදල රු. 2,820,047 ක් වැඩිපුර ගිණුම් ගත කර තිබීම හේතුවෙන් වසරේ ආදායම හා ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) වැටුප් රහිත නිවාඩු ලබා ගත් සේවකයින් 134 කගෙන් අයවිය යුතු රු.886,427 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ දි මූල්‍ය ප්‍රකාශනවලට ගලපා නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසය සඳහා ගෙවිය යුතු රු.784,147 ක් වූ ආරක්ෂක ගාස්තු ගිණුම් ගත කර නොතිබීම හේතුවෙන් වර්ෂයේ වියදම හා ගෙවිය යුතු මුදල එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

**1.3.2 අසම්භාව්‍ය බැරකම්**

---------------------

සභාව විසින් නිසි මූල්‍ය පරිපාලනයක් පවත්වා නොගැනීම නිසා ප්‍රධාන ජංගම ගිණුම මඟින් ලබාගැනීමට සිදු වී තිබූ අයිරා පහසුකම් වෙනුවෙන් සභාව සතු රු.19,416,309 ක් වටිනා ස්ථාවර තැන්පතු ඇපයට තබා තිබුණ ද මේ බැව් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

**1.3.3 නොසැසඳූ පාලන ගිණුම්**

-------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු. 529,237,518 ක් වූ ගිණුම් විෂයයන් 13 කට අදාල ශේෂයන්, ඒවාට අදාල උපයෝගී ලේඛන වල දැක්වෙන ශේෂයන් සමඟ සැසඳීමේදී, මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දැක්වීම් රු. 36,329,011 ක් ද, අඩුවෙන් දැක්වීම් රු. 10,951,147 ක් ද වශයෙන් වෙනස්කම් නිරීක්ෂණය විය.

**1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය හා ඊට පෙර කාලසීමාවන්ට අදාලව පානදුර ප්‍රාදේශිය සභාවේ කරදියාන කසල අංගණය වෙත කසල බැහැර කිරීම වෙනුවෙන් එම සභාවෙන් ලැබිය යුතු රු. 1,899,833 ක මුදල 2015 දෙසැම්බර් 31 දින වන විටත් ලැබී නොතිබුණි.කසල බැහැර කිරීම සඳහා බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය සමඟ ඇති කරගෙන තිබූ ගිවිසුම 2014 ජූනි 04 දිනෙන් අවසන් වුවද එය යාවත්කාලීන කිරීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.

(ආ) සභා බල ප්‍රදේශයට අයත් තෙලවල හා කල්දමුල්ල යන කොට්ඨාශවලට අදාලව 2011, 2012 , 2013 වර්ෂවල ගල්කිස්ස උසාවියේ පවරා තිබූ නඩු 129 කට අදාලව ලැබිය යුතු දඩ හා බදු මුදල් රු. 263,350 ක් සභාව වෙත ලැබී නොතිබුණි.

(ඇ) ස්ථාන මාරුවී ගිය සේවකයින් 16 දෙනෙකුගෙන් අයවිය යුතු 841,846 ක් හා සේවය හැරගිය , විශ්‍රාම ගිය සේවකයින් 131 දෙනෙකුගෙන් සේවක ණය වෙනුවෙන් අයවිය යුතු රු. 1,572,924 කින් 2015 වර්ෂය තුලදී කිසිදු මුදලක් අයවී නොතිබුණි.

(ඈ) ලැබිය යුතු ශේෂවල වර්ෂ 05 කට පෙර සිටම කිසිදු මුදලක් අය නොවී පැවති එකතුව රු. 15,569,883 ක් වූ ශේෂයන් 09 ක් දිගින් දිගටම ඉදිරියට ගෙනවිත් තිබුණු අතර එම අයවිය යුතු වටිනාකමින් සියයට 92 ක් වීථි ආලෝක නඩත්තු කිරීම්, විනෝද බදු හා විමධ්‍යගත අත්තිකාරම් වලින් ලැබිය යුතු විය.

(ඉ) නාගරික මන්ත්‍රීවරුන් තිදෙනෙකුගෙන් අයවිය යුතුව තිබූ හිඟහිටි ඉන්ධන දීමනා පිළිවෙලින් රු. 268,600,රු.268,100 ක් සහ රු.49,867 ක් වශයෙන් වූ එකතුව රු.586,567 ක මුදලින් සමාලෝචිත වර්ෂය තුළදි කිසිදු මුදලක් අයකරගෙන නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසානයේ දී පැවති රු. 19,913,489 ක් වූ ආපසු ගෙවිය යුතු තැන්පත් ශේෂය තුළ වසර 02 ක කාලයක් ඉක්මවා තිබුණු ශේෂවල එකතුව රු.4,254,578 ක් වූ අතර ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571 විධිවිධාන ප්‍රකාරව ඉකුත් තැන්පතු නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායමට වඩා වැඩි වූ පුනරාවර්තන වියදම රු.17,040,824 ක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.93,282,206 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

(අ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 396 ට අනුව නිකුත් කර මාස 06 ක කාලයක් ඉකුත් වූ එකතුව රු. 34,588 ක් වටිනා චෙක්පත් 10 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 371 (2) ප්‍රකාරව අත්තිකාරම් ලබාගත් කාර්යය නිමවූ වහාම එම අත්තිකාරම් මුදල් නිරවුල් කිරීමට කටයුතු කලයුතු නමුත් සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 26කදී ලබාගත් රු.275,500 ක් වූ අත්තිකාරම් මුදල් නිරවුල් කිරීම දින 27 සිට දින 342 දක්වා ප්‍රමාද කර තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව අත්තිකාරම් ලබාගත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හෝ එදිනට පෙර එම අත්තිකාරම් පියවිය යුතු නමුත් 2000 වර්ෂයේ සිට 2009 දක්වා වූ කාල සීමාව තුළ ලබාගත් අවස්ථා 19 කට අදාලව රු.71,402 ක් වූ අත්තිකාරම් මුදල් 2015 දෙසැම්බර් 31 තෙක් පියවීමට කටයුතු කර නොතිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව නගරාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබුණු තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත පරිදි විය.

| | 2015 | | | | 2014 | |
|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | වර්ෂයට අදාළ හිඟය | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | තථ්‍ය අයකර ගත යුතු | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| වරිපනම් හා බදු | 110,290 | 58,701 | 51,589 | 149,204 | 87,722 | 111,884 |
| බදු කුලී | 12,622 | 11,159 | 1,463 | 3,194 | 10,973 | 3,395 |
| බලපත්‍ර ගාස්තු | 12,726 | 11,083 | 1,643 | 54,045 | 14,370 | 53,304 |
| වෙනත් ආදායම් | 152,924 | 152,924 | - | 10,140 | 195,256 | 10,140 |
| | 288,562 | 233,867 | 54,695 | 216,583 | 308,321 | 178,723 |

**2.3.2** **වරිපනම් බදු**

**-------------**

මහා නගර සභා ආඥා පනතේ 252 වගන්තිය ප්‍රකාරව නාගරික කොමසාරිස් විසින් හිඟ වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයේ මූලා ප්‍රකාශන අනුව රු.145,975,458 ක හිඟ වරිපනම් බදු ශේෂයක් පැවතුණි. මෙම ශේෂය තුළ රු.50,000 ඉක්ම වූ ස්ථාන 128 කට අදාලව රු.56,313,028 ක ශේෂයන් අන්තර්ගත වී තිබුණි.

**2.3.3** **බදු හා බලපත්‍ර**

**--------------**

(අ) කුලියට දී තිබූ කඩ කාමර 291 ක බදු කරුවන් 130 දෙනෙකු 2015 දෙසැම්බර් 31 දින වන විට නියමිත පරිදි කුලි මුදල් ගෙවා නොතිබුණු අතර හිඟ කුලී මුදල රු.3,057,788 ක් විය.

(ආ) මහා නගර සභා ආඥා පනතේ 266 "අ" විධිවිධාන පරිදි සභාවට අය විය යුතු කිසියම් මුදලක් අත්හැර දැමීම යෝජනා සම්මතයක් මගින් සිදුකළ යුතු වුවත් සභාවේ යෝජනා සම්මතයකින් තොරව සභාව අමතා එවන ලද ආයාචනා හා පෙත්සම්, පැමිණිලි සභාව හමුවේ තැබීම යටතේ සාකච්ඡා කොට සමාලෝචිත වර්ෂයේ දී සභා බල ප්‍රදේශයේ ආයතන 2175 කින් සභාවට ලැබිය යුතු බදු හා බලපත්‍ර ගාස්තු නිදහස් කර තිබුණු අතර ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී ආයතනවලින් ලැබිය යුතු බදු හා බලපත්‍ර ගාස්තු ආදායම් සභාවට අහිමි වී තිබුණි.

(ඇ) 2014 වර්ෂයේ බලපත්‍ර ලබාගෙන නොමැතිව 2013 වර්ෂයේ ව්‍යාපාර බදු ගෙවා නොමැති ව්‍යාපාරිකයන් වෙනුවෙන් සභාව විසින් පවරා තිබූ නඩු ඉල්ලා අස්කර ගැනීම හේතුවෙන් බදු නොගෙවූ ව්‍යාපාර 52 ක් හා බලපත්‍ර ලබා නොගත් ව්‍යාපාර ආයතන 117 කින් ලැබිය යුතු බලපත්‍ර ගාස්තු හා උසාවි දඩ ආදායම් සභාවට අහිමි වී තිබුණි.

**2.3.4** **උසාවි දඩ**

**----------**

2015 වර්ෂයේ දි පිළියෙල කළ ලැබිය යුතු දඩ මුදල් වාර්තා හා ලැබුණු මුදල් අතර රු. 10,341,899 ක වෙනසක් දක්නට ලැබුණි.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**-------------------------**

**3.1** **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**---------------------------**

(අ) 2012 සිට 2015 දක්වා සේවකයින් 208 දෙනෙකු වෙනුවෙන් එකතුව රු.13,825,119 ක් වූ දායක මුදල් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල වෙත යවා තිබුණද එම සේවකයින් අරමුදලේ ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය අයදුම්පත් ඉදිරිපත් කොට අංක ලබා ගැනීමට සභාව මෙතෙක් කටයුතු කර නොතිබුණි.

(ආ) 2016 පෙබරවාරි 15 දින සිදු කරන ලද භෞතික පරීක්ෂාවට අනුව රු.1,110,133 ක් වටිනා කසල බඳුන් 4546 ක් පිළිබඳ තොරතුරු විගණනයට අනාවරණය නොවුණු අතර එම කසල බඳුන් බෙදා දුන් කිසිවෙකුගෙන් ඔවුන්ගේ අනන්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා අත්සන් ලබාගෙන නොතිබුණි.

(ඇ) සභාවේ සේවකයන් විශ්‍රාම වැටුපට හිමිකම් ලැබීම හේතුවෙන් 2006 වර්ෂයේදී දායක විශ්‍රාම වැටුප් වෙනුවෙන් ගෙවා නැවත ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ආපසු එවා ඇති රු. 2,095,581 ක් වටිනා චෙක්පත් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් නොගෙන 2015 වර්ෂයේ දී ආදායමට ගෙන තිබුණි.

## 3.2 ආර්ථික නොවූ ගණුදෙණු

---------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මග නැගුම ව්‍යාපෘති හා අභ්‍යන්තර මාර්ග සංවර්ධන ව්‍යාපෘති සඳහා මුදල් ලැබිමට පෙර එම ව්‍යාපෘතිවලට ගෙවීම් කිරීම සඳහා ණය ලබා ගැනීම හේතුවෙන් 2015 වර්ෂයේ දි රු.1,646,442 ක ණය පොලියක් හා ගෙවීම ප්‍රමාද වීම මත රු.8,068 ක අධි පොලියක් මොරටුව මහජන බැංකුවට ගෙවීමට සිදු වී තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 128 ප්‍රකාරව නිසි මූල්‍ය පරිපාලනයක් පවත්වාගත යුතු වුවද, ඊට අනුගත නොවී කටයුතු කිරීම නිසා 2015 වර්ෂයේ ජූනි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා ප්‍රධාන ජංගම ගිණුමේ අඛණ්ඩ අයිරාවක් හා පළාත් සභා හා විමධ්‍යගත අරමුදල් ගිණුමේ 2015 අගෝස්තු , ඔක්තෝබර් හා දෙසැම්බර් මාස වල අයිරාවක් පැවතිම හේතුවෙන් රු. 817,908 ක අයිරා පොලියක් ගෙවීමට සිදුවී තිබුණි.

## 3.3 අවිධිමත් ගණුදෙණු

--------------------

මහා නගර සභා ආඥාපනත (252 අධිකාරය) 188(1) වගන්තිය ට අනුව වියදම් ප්‍රතිපාදනයන්ගෙන් ආවරණය නොවන වියදම් ලෙස මහා සභා රැස්වීම් වලට සහභාගි විම සඳහා ඇදුම් මිලදි ගැනිම වෙනුවෙන් නිලධාරින් 17 දෙනෙකු සඳහා 2014 හා 2015 වර්ෂවලදී පිළිවෙලින් රු.194,130 ක් හා රු.221,350 ක් සභාව විසින් ගෙවා තිබුණි.

## 3.4 හදුනා ගත් අලාභ

---------------

(අ) වගකිම් කාලය තුළ දැවී ගිය සී.එෆ්.එල්. විදුලි බුබුළු වෙනුවට ඒවා මිලට ගත් ආයතනයෙන් නැවත ලබා දිමේදී විදුලි බුබුළු 164 ක් අඩුවෙන් ලබාදිම නිසා සභාවට රු.52,480 ක අලාභයක් සිදු වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ විදුලි ගාස්තු සඳහා ගෙවීම් කිරිමේ දී ප්‍රමාද වී ගෙවීම් කිරිම හේතුවෙන් අධිභාර මුදල් වශයෙන් රු.22,655 ක් ගෙවා තිබුණි.

## 3.5 වාහන උපයෝජනය

---------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) මහා නගර සභා ආඥා පනතේ 228 වගන්තිය ප්‍රකාරව වාහන සේවා සිදුකිරීම සඳහා කිසිදු ගිවිසුමකට එළඹීමෙන් තොරව අදාල ආයතනයට සමාලෝචිත වර්ෂය තුලදී රු. 975,100 ක් ගෙවා තිබුණි. සේවා සිදු කළ බවට සඳහන් වාහන ඒ සඳහා ධාවනය කළ බව සටහන් කර නොතිබුණු අතරම අදාල ලොග් පොත්වලද ඒ බව සටහන් කර නොතිබුණි.

(ආ) 2003 මාර්තු 29 දින ලියාපදිංචි කරනු ලැබ තිබූ සභාව සතු ගිලන් රථයක් විධිමත් ක්‍රමවේදයකින්, අනුමැතියකින් හෝ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් වෙත දැනුම් දීමකින් තොරව රු. 1,915,000 ක පිරිවැයක් දරා සභාව විසින් මගී වාහනයක් බවට පරිවර්තනය කර තිබුණි. මේ සම්බන්ධයෙන් වූ ලිපි ගොනුව විගණනයට ඉදිරිපත් නොවිය.

(ඇ) සභාව සතු පිරිවැය රු. 4,500,000 ක් වූ කැබ් රථය වසර 02 ක පමණ කාලයක සිට අස්ථානගත වී තිබුණි.

(ඈ) නගර සභාව සතු වාහන 9 කට අදාලව ලියාපදිංචි සහතික විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඉ) සභාව තුළ ධාවනය වන රු. 15,873,045 ක් වටිනා වාහන 37 ක් වාහන උපලේඛනයට ඇතුලත් කර නොතිබුණි.

(ඊ) සභාවේ වාහන 13 කට අදාලව දෛනික ධාවන සටහන් පොත්ද වාහන 27 කට අදාලව වාර්ෂික ආදායම් බලපත්‍ර ද වාහන 17 කට අදාලව වාර්ෂික ආදායම් බලපත්‍ර හා රක්ෂණ සහතිකද විගණනයට ඉදිරිපත් නොවීය.

(උ) 1985 වර්ෂයේ දී සහ 1997 වර්ෂයේ දී සභාව වෙත ලැබී තිබුණු ගිනි නිවීමේ රථ 02 ක් 2015 දෙසැම්බර් 31 දින වන විටත් ලියාපදිංචි කර නොතිබුණි.

(ඌ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 1642 ප්‍රකාරව වාහන සම්බන්ධ හදිසි අනතුරු කොතරම් සුළු වුවද පොලිසියට වාර්තා කළ යුතු බව දක්වා ඇතත් සමාලෝචිත වර්ෂය තුළ වාහන අනතුරු අළුත්වැඩියාව සඳහා රු.219,750 ක් වැය කරන ලද හදිසි අනතුරු 03 ක් සම්බන්ධයෙන් එලෙස වාර්තාකර නොතිබුණි.

(එ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 1645 හා 1646 ප්‍රකාරව දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ ඊළඟ මාසයේ 15 දිනට පෙර විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එසේ ඉදිරිපත් කර නොතිබුණු අතර සභාවේ කිසිදු වාහනයක් සම්බන්ධයෙන් මාසික සාරාංශ පිළියෙල කර නොතිබුණි.

(ඒ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 1653 ප්‍රකාරව ධාවනය වන වාහනවල මයිලෝ මීටරය ක්‍රියාත්මකව පැවතිය යුතු අතර ක්‍රියා විරහිත වුවහොත් වහා අළුත්වැඩියා කල යුතු බව දක්වා ඇතත් සභාව සතු වාහන 35 ක මයිලෝ මීටර වර්ෂ 1 සිට 5 දක්වා කාලයක සිට අක්‍රියව පැවතුණි.

(ඔ) 1990 ඔක්තෝම්බර් 10 දිනැති අංක 90/41 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 ඡේදය අනුව සෑම මාස 06 කට වරක් වාහනවල ඉන්ධන පරිභෝජනය සම්බන්ධයෙන් ස්වාධීන නිලධාරියකු විසින් පරීක්ෂාවක් කළ යුතු බව දක්වා ඇතත් සභාව විසින් වාහනවල ඉන්ධන දහනය සම්බන්ධයෙන් එසේ සිදු කර නොතිබුණි.

(ඕ) 2016 පෙබරවාරි 29 දිනැති ප්‍රධානලේකම්ගේ (බස්නාහිර පළාත) අංක 01/2016 දරණ කාර්යාල චක්‍රලේඛයට පටහැනිව නිල වාහන සඳහා හිමිකම් නොලබන සභාවේ නියෝජ්‍ය නගරාධිපතිවරයා විසින් සභාව සතු කැබ් රථයක් සිය රාජකාරි සඳහා හා නිවසට යාම් ඊම් සඳහා භාවිතා කර තිබුණි.

(ක) සමාලෝචිත වර්ෂය තුළ සිදුවූ වාහන අනතුරු 04 සඳහා වගකිවයුත්තන් නිශ්චය කිරීමටත් අලාභ අදාල වගකිව යුත්තන්ගෙන් අයකර ගැනීමටත් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 103,104,105 හා 110 නියමයන් පරිදි සභාව කටයුතු කර නොතිබුණි.

**3.6 කොන්ත්‍රාත් පාලනය**

---------------------

2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.2 (iv) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, ප්‍රජා පාදක සංවිධානවලට උප කොන්ත්‍රාත් දිය නොහැකි වුවද එයට පටහැනිව ව්‍යාපෘති 06 ක් සඳහා බාහිර ආයතනවලට රු.1,999,000 ක් ගෙවා තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී ආදායම් හා වියදම් විෂයයන් අතර ප්‍රතිපාදන මාරු කිරීමෙන් හා අතිරේක ඇස්තමේන්තු ලබාගැනීමෙන් අනතුරුවද අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම්වල සියයට 5 සිට සියයට 38 දක්වා විචලනයන් පැවැති අවස්ථා 17 ක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

(ආ) රු.335,720,000 ක ආදායමක් අපේක්ෂා කළ ආදායම් ශීර්ෂ 08 කින් සමාලෝචිත වර්ෂය තුළ කිසිදු ආදායමක් ලැබී නොතිබුණි.

(ඇ) දිරන අපද්‍රව්‍ය එකතු කිරීම සඳහා රු.8,800,000 ක් වටිනා ලීටර 18 ප්‍රමාණයේ ප්ලාස්ටික් බඳුන් 40000 ක් මිලදී ගෙන බෙදා හැරීමට සභාව කටයුතු කර තිබුණ ද ඒ වෙනුවෙන් 2015 වර්ෂයේ අයවැය ලේඛනයෙන් හෝ පරිපූරක ඇස්තමේන්තුවක් මගින් හෝ මුදල් වෙන් කිරීමක් කර නොතිබුණි.

### 4.2 නොවිසඳී ඇති හා පිළිතුරු නොදුන් විගණන විමසුම්

සමාලෝචිත වර්ෂය සඳහා නිකුත් කරන ලද විගණන විමසුම් 23 ක් සඳහා 2016 අප්‍රේල් 30 දින වන විටත් පිළිතුරු / කරුණු පැහැදිලි කර නොතිබුණු අතර,එකී විමසුම්වලට භාජනය වූ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.77,628,008 ක් විය.2014 වෙනුවෙන් නිකුත් කළ විගණන විමසුම්වලින් 11 කටද ඉහත සඳහන් දින වන විටත් පිළිතුරු සපයා නොතිබුණි.

### 4.3 වත්කම් කළමණාකරණය

**නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2010 වර්ෂයේ සිට කිසිදු නිකුත් කිරීමකින් තොරව ලුනාව ව්‍යාපෘතියෙන් ලද වාහන අමතර කොටස් වර්ග 26 කට අදාලව ඒකක 154 ක් හා තවත් අයිතම වර්ග 305 කට අදාලව ඒකක 1,277 ක් කිසිදු භාවිතයකට නොගෙන ගබඩාවේ ගොඩගසා තිබුණි.

(ආ) මධ්‍යම වෙළඳ පොළ ගොඩනැගිල්ලේ දෙවන මහල 2010 ඔක්තෝබර් 31 දිනෙන් පසු ආදායම් ලැබෙන පරිදි කිසිදු පුද්ගලයෙකුට හෝ ආයතනයකට කුලියට දිමට සභාව කටයුතු කර නොතිබුණු අතර සභාවට අයත් කිසිදු කඩ කාමර ගොඩනැගිල්ලක් වසර 10 ක පමණ කාලයක සිට හුණු පිරියම් කිරීමක් හෝ අළුත් වැඩියාවක් සභාව විසින් සිදු නොකිරීම හේතුවෙන් ඉතා අබලන් තත්වයේ පැවතුණි.

(ඇ) වත්කම් ලේඛනයේ ඇතුළත් රු.10,417,864 ක් පිරිවැය වූ වාහන 12 ක් වසර 1 සිට වසර 7 දක්වා කාලයක සිට නිශ්ක්‍රීයව පැවතුණි.

(ඇ) සභාව නමින් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන සාමාන්‍ය ඉතිරි කිරීමේ ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට රු.7,460,159 ක ශේෂයක් පැවතුණු අතර මෙම ගිණුම් ශේෂය සඳහා සාමාන්‍ය ඉතිරි කිරීමේ පොලී අනුපාතයක් පමණක් ලැබෙන නමුත් දිගු කලක් තිස්සේ ඌණ උපයෝජිතව පැවතින.

**4.4** **අභ්‍යන්තර විගණනය**

--------------------

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133(1) සහ (2) හි දැක්වෙන විධිවිධාන පරිදි අභ්‍යන්තර විගණන අංශයේ කටයුතු සංවිධානය කරගෙන නොතිබුණි.

**5.** **පද්ධති හා පාලනය**

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) මූල්‍ය පාලනය
(ආ) අයවැය පාලනය
(ඇ) ගිණුම්කරණය
(ඈ) ආදායම් පරිපාලනය
(ඉ) වත්කම් කළමනාකරණය
(ඊ) ණයගැති / ණයහිමි පාලනය
(උ) කොන්ත්‍රාත් පාලනය